# ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින විගණක සහකාර (II ශ්‍රේණිය) තනතුර සඳහා නියමිත සුදුසුකම් සපුරා ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### විගණක සහකාර (II ශ්‍රේණිය)

සුදුසුකම් : (1) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ සිංහල භාෂාව/දෙමළ භාෂාව, ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය සහ ගණිතය යන විෂයයන්ට සම්මාන සමාර්ථ සහිතව විෂයයන් හයක් එක්වරක දී සමත් වී තිබීම.

සහ

(2) අ.පො.ස. (උ.පෙළ) විභාගය එක් වරක දී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

සහ

(3) (a) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CASL) ප්‍රාථමික අදියර/ආවසරික I/ පදනම් අදියර/ ගිණුම්කරණ සහ ව්‍යාපාර සහතික පත්‍ර පාඨමාලාවේ පළමු අදියර (CAB I)/ විධායක අදියර හෝ ඊට සමාන සුදුසුකම්.

හෝ

(b) වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ (CIMA) පදනම් අදියර සමත් වීම.

හෝ

(c) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගණකාධිකාරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව සමත් වී තිබීම.

හෝ

(d) ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ සාමාජිකත්වය ලබා තිබීම.

(4) රජයේ හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක විගණන කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද.

සටහන : පිළිගත් ආයතනයකින් ලබා ගත් පරිගණක යෙදවුම් පිළිබඳව මාස 06 කට නොඅඩු සුදුසුකමක් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් පරිමාණය : රු. 37,275 - 18 X 495 – 46,185 [U-MN 2 (II)]

මෙම තනතුර සඳහා මූලික වැටුපට අමතරව පහත සඳහන් දීමනා ගෙවනු ලැබේ.

- ජීවන වියදම් දීමනාව (රු. 7,800/=)
- අතිරේක මාසික දීමනාව (20%)
- මාසික අන්තර් දීමනාව (45%)

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

තමාගේ නම සහ ලිපිනය ලියන ලද සෙ.මී. 23 x 10 ප්‍රමාණයේ මුද්දර කවරයක් 2021.02.05 දිනට පෙර ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල, නුගේගොඩ ලිපිනයට එවීමෙන් හෝ ආයතන අංශය වෙත පැමිණ අයදුම්පත් ලබා ගත හැකිය. විශ්වවිද්‍යාලය විසින් නිකුත් කරන ලද අයදුම්පත් හැර වෙනත් අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/අනධ්‍යයන ආයතන, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය නාවල, නුගේගොඩ යන ලිපිනයට 2021.02.12 **දින හෝ එදිනට පෙර ලැබෙන සේ** එවිය යුතුය. නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය, රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය. අයදුම්පත් සමඟ සහතිකවල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, සහතිකවල පිටපත් අමුණා නොතිබීම, අපැහැදිලි බව හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළ විට කුමන හේතුවක් නිසා හෝ යළි සලකා බලනු නොලැබේ.

අයදුම්පත් සහ විස්තර https://www.ou.ac.lk/vacancies/ වෙතින් ද ලබාගත හැක.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
නාවල, නුගේගොඩ

2021.01.24

University Web Site : www.ou.ac.lk